**ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2017**

---

ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ප්‍රථම ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹී අංක 3425 එස්ආර්අයි(එස්එෆ්) දරණ ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.ශක්‍යතා අධ්‍යයනය, විස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන ලේඛන පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ආරම්භක අදියර තුළදී ක්‍රියාත්මක කිරීමේ සහාය ලබාදීම මඟින් මාර්ග, දුම්රිය හා වරාය යන උප අංශවල ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතිවල ආරම්භක කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එස්ඩීආර් මිලියන 17.47 (එක්සත් ජනපද ඩොලර් මිලියන 27.7) ක් වූ අතර ඉන් රු.මිලියන 3,655.43 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 24.42 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ ගිවිසුම අනුව, රු.මිලියන 1,697.49 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 11.34 ක් ව්‍යාපෘතියේ මාර්ග උප අංශය සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 28 දින ආරම්භ කරන ලද අතර 2022 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින්ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක තැන්පතු, අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව,මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා

සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක තැන්පතු, අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.,

(ඇ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩුව

සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් උපදේශකවරයා මඟින් රු.මිලියන 3.04 පිරිවැයකට ප්‍රසම්පාදනය කළ ස්ථාවර වත්කම් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන් තුවේ කරන ලද වෙන් කිරීම | 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | එක්සත් ජනපද ඩොලර් මිලියන | රු.මිලියන | රු.මිලියන | එක්සත් ජනපද ඩොලර් මිලියන | රු.මිලියන |
| ආ.සං.බැ. | 10.00 | 1496.91 | 250 | 0.59 | 92.34 |
| ශ්‍රීලංර | 1.34 | 200.58 | 30 | - | 0.03 |
| එකතුව | **11.34** | **1697.49** | **280** | **0.59** | **92.37** |

ව්‍යාපෘති කාල සීමාව තුළදී ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලය සඳහා වගකීම් නියම කරමින් සම්පූර්ණ ව්‍යාපෘති කාල සීමාව ආවරණය වන පරිදි මූල්‍ය හා භෞතික ඉලක්කයන් ඉස්මතු කර දැක්වෙන සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. කෙසේ වුවද, උපදේශන සේවාවන් ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ රු.මිලියන 280 ක මුදලක් වෙන්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි රු.මිලියන 93 ක වෙන් කිරීමක් පමණක් කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

-----------------

විස්තරාත්මක සැලසුම්කරණය වෙනුවෙන් උපදේශන සේවා සඳහා වූ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘතිය විසින් 2017 පෙබරවාරි 20 දින ප්‍රදානය කර තිබුණු අතර මාස 06 ක් තුළ වැඩ නිම කිරීමට එකඟ වී තිබුණි. එය ශක්‍යතා අධ්‍යයනය, පාරිසරික තක්සේරුව, නැවත පදිංචි කිරීම් අධීක්ෂණය, සමාජීය තක්සේරුව සහ සිවිල් වැඩ සඳහා ලංසු ලේඛන පිළියෙල කිරීම යනාදිය ඇතුළත් කාර්යයන් 8 කින් සමන්විත වේ. කෙසේ වුවද, ඒ පිළිබඳ අවසන් වාර්තා ව්‍යාපෘතියේ ඊට පසුව සිදුවන කාර්යයන් ආරම්භ කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2018 මාර්තු 31 වන විටත් නිකුත් කර නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

උපදේශකවරුන්ට කරන ගෙවීම් මත දේශීය බදු සඳහා නිදහස්වීම් ලබා ගැනීමට ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘතිය ආරම්භක අදියරයන්හිදී නිසි පියවර ගෙන නොතිබුණි. එම නිසා, 2017 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 14.44 ක් වූ එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමට සිදු වී තිබුණි.